රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

මගේ අංකය / எனது இல / My No: COM/TRANS/V/වාස්මා-2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.04.26

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශිය ලේකම්වරුන්

**ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මටද පිටපතක් සහිතව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් අමතා ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/4/10/2022 හා 2022.03.31 දිනැති ලිපිය හා බැදේ.

02. ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධව නියමිත කාලය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සියලු අභියාචනා පිළිබඳව එම කොමිෂන් සභාවේ තීරණ මේ වන විට ලබාදී ඇති අතර, ඒ අනුව 2022 වාර්ෂික ස්ථාන මාරු තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පල කර ඇත.

03. නමුත්, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වූ දිනෙන් පසුවද ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධ අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරිපත් වන බව සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, එම නිලධාරීන් නියමිත කාලය තුළ අභියාචනා ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය කරන ලදුව එලෙස ලැබෙන අභියාචනා සලකා නොබලන බවට තීරණය කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එම තීරණය සියලු නිලධරයන්ට දැනගැනීමට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.